බදුල්ල වේවැස්ස ප්‍රදේශයේ මවක් සිය දරුවන්ද සමගින් දිවි තොර කරගැනීමට උත්සාහ කළ පුවතක් මාධ්‍ය තුළ වාර්තා වී තිබුණි. ඒ පිළිබඳ අපගේ නිරීක්ෂණයන් පහත පරිදි වේ.

1) ඇතැම් පුවත්පත් දිවි තොර කරගැනීමට තැත් කළ පුවත ප්‍රමුඛතාවයකින් යුතුව මුල් පිටුවේම පළ කොට තිබිණි. එය අනුකාරක දිවි තොර කරගැනීම් සඳහා පෙළඹවීම් ඇති කළ හැක්කක් වීමට ඉඩ ඇතැයි දිවි තොර කරගැනීම් පිළිබඳ මාධ්‍ය ආචාර ධර්ම පවසයි.

2) පුවත වාර්තා කළ සියලුම මාධ්‍ය දිවි තොර කරගැනීමට තැත් කළ ආකාරය සඳහන් කර තිබිණි. ඒ ඔස්සේ, එම ක්‍රමය යොදාගනිමින් සිදුවිය හැකි එය අනුකාරක දිවි තොර කරගැනීම් වලට උත්ප්‍රේරණයක් සැපයීමට හැක.

3) පුවත වාර්තා කළ සියලුම මාධ්‍ය උපකාරක අංක සඳහන් කර නොතිබුණි. උපකාරක අංක සඳහන් නොකිරීම තුළින්, දිවි තොර කරගැනීමට නැඹුරුවක් ඇති අයෙකුගේ දිවි බේරාගැනීමට ඇති ඉඩක් ගිලිහී යා හැක.

ඩේලි නිව්ස්, ද මෝර්නින්ග් හෝ ද අයිලන්ඩ් පුවත්පත් මෙම දිනයේදී මෙම පුවත වාර්තා කර නොතිබුණි.

දිවි තොර කරගැනීම් හෝ ඊට උත්සාහ කිරීම් වාර්තා කිරීමේදී වඩාත් ආචාර ධර්මානුකූල, ප්‍රවේසම් සහගත ප්‍රවේශයක් ගැනීම ඔස්සේ, ගිලිහී යා හැකි තවත් ජීවිතයක් බේරා ගැනීමට ඉඩක් ලැබෙනු ඇත. එය අපගේ වගකීමක් ලෙසින් සලකමු.

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:
https://media.samaritans.org/.../Media_Guidelines_FINAL.pdf
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...